1973

briefed 7/7

ව්‍යාපාර කළමණාකරණ කමිටු වාර්තාව 2020 ජූනි මාසය

මිණිපේ මහා වාරිමාර්ග ව්‍යාපාරය



- දිනය :- 2020/ 06/ 11
- ස්ථානය :- නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය-මිණිපේ
- වේලාව :- පෙ.ව. 10.00
- සහභාගිත්වය :- පැමිණීමේ ලේඛණය අමුණා ඇත.

ආගම සිහිකිරීම හා ව්‍යාපාරයේ නිර්මාතෘන් සිහිකිරීමෙන් අනතුරුව පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම සිදු කරන ලදි.

අරමුණු

1. ආයතනික සංවර්ධන කටයුතු විමසා බැලීම.
2. 2020 යල කන්නයේ වගා කටයුතුවල තත්ත්වය විමසා බැලීම.
3. වාරිමාර්ග කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම
4. පොහොර සහනාධාරය ලබාදීම සම්බන්ධ සාකච්ඡා කිරීම.

Covid -19 වසන්ගත තත්ත්වය හමුවේ පැවති ඇදිරිනීතිය නිසා 2020 යල කන්න රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බවත් ඒ වන විට පෙර කන්න රැස්වීම පවත්වා තිබූ බැවින් මහනුවර,මාකලේ දිස්ත්‍රික් ලේකම්තුමාන්ලාගේ උපදෙස් පරිදි පෙර කන්න තීරණ ම කන්න තීරණ ලෙස සලකා 2020 යල කන්න වගා කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරමින් ඒ ඒ පියවරයන්හි ආයතන සංවර්ධන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම සඳහා අවශ්‍යතාව ලබා දෙන ලදි.

ඉදිරිපත්කරණ / වගකිවයුතු නිලධාරියා/ ආයතනය	අදහස් / ගැටළුව
1 පියවර සංවර්ධන නිලධාරි-	01.ආයතන සංවර්ධන කටයුතු 2020 යල කන්නය ආරම්භ වීමටත් පෙර සිට රටේ පැවති covid -19 වසන්ගත තත්ත්වය හේතුවෙන් යල කන්න වගා තීරණ පිළිබඳව මහ සභා පවත්වා දැනුවත් කිරීමට නොහැකි වූ නමුත් ඇදිරිනීතිය තත්ත්වය තුල වුවද 1 පියවර ප්‍රා.ගොා.සං.සභාපතිතුමා ඇතුළු ගොවි ව්‍යාපකයින් කිහිප දෙනෙකු විසින් 1,2 පියවර සියලු ගොවීන් දැනුවත් කිරීම සඳහා කටයුතු කළ බවත් ඊට ස්තුතිවන්ත වන බවත් ගොවි ගැටලු විසඳීමට මැදිහත් වූ බවත් "හෙළ සුවය " ආයතනය හා සම්බන්ධ වීමෙන් දේශීය වී වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ බවත් ඉදිරියේදී රට යථාතත්ත්වයට පත්වීමෙන් පසු අදාල නිළවරණ මහසභා පැවැත්වීමට කටයුතු කරන ලෙසත් දන්වා සිටින ලදි.
2 පියවර සංවර්ධන නිලධාරි	covid -19 වසන්ගත තත්ත්වය තුල ඇති වූ ඇදිරිනීති තත්ත්වය තුල වුවද ගොවි සංවිධාන සමග නිරතුරුවම සම්බන්ධතානය පවත්වාගනිමින් අත්‍යාවශය කටයුතු කිරීමට කටයුතු කළ බවත් ප්‍රා.ගොා.සං.රැස්වීම පවත්වා කරුණු සාකච්ඡා කල බවත් පැවැත්වීමට නියමිත නිළවරණ ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු කරන ලෙසත් විගණනය කර අවසන් සියලු ගොා.සං. ඵම වාර්තා දෙකෙන් 1ක් සම කාර්යාලයට ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉදිරි කටයුතු සාමාන්‍ය ලෙස සිදුකිරීමට හැකියාව ලැබෙන බවත් දන්වා සිටින ලදි.
3 පියවර ආයතන සංවර්ධ නිලධාරි	4 පියවර ආයතන සංවර්ධන නිලධාරි ව්‍යාපාර කමිටුවට සහභාගි නොවූයෙන් 3,4 පියවර දෙකෙන්ම ප්‍රගතිය 3 පියවර ආයතන සංවර්ධන නිලධාරි විසින් ඉදිරිපත් කරන ලදී. covid -19 වසන්ගත තත්ත්වය නිසා පැවති ඇදිරිනීති තත්ත්වය තුල වුවද ගොවි සංවිධාන සමග නිරතුරුවම සම්බන්ධතානය පවත්වාගනිමින් අත්‍යාවශය කටයුතු කිරීමට කටයුතු කළ බවත් පැවැත්වීමට නියමිත නිළවරණ ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු කරන ලෙසත් ව2019 වර්ෂයට අදාල විගණන වාර්තා කඩිනමින් අවසන් කර ගන්නා ලෙසත් දන්වා සිටින ලදි

4 පියවර ප්‍රා.ගෙ.සං.සභාපති	02.ප්‍රා.ගෙ.සං. අදහස් දැක්වීම 2020 යල කන්න වගා කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට හැකි වූ බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ සියලු නිළධාරීන්ට ස්තුතිවන්ත වන බවත්, 4 පියවර ඉන්මාස් කාර්යාලය මෙ වන විට ගොවීන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට හැකි මට්ටමේ පවතින බවත් ඉදිරියේදී පලතුරු පැල සිටුවීමේ වැඩසටහනක් දියත් කිරීමට 4 පියවර ප්‍රා.ගෙ.සංවිධානය සූදානම් බවත්, යල කන්න වගා කටයුතු වේලාසන අවසන් කිරීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදි.
කරවුගහවැව - සභාපති	ව්‍යාපාර කමිටුවෙදී අදහස් දැක්වීමට වැව්පහට අවශ්‍යතාවක් ලබා දෙන්නේ නම් කරවුගහවැවටද අවශ්‍යතාවක් ලබා දෙනා ලෙසත්, ලක්ෂ 3ක් පමණ වියදම්වෙතැයි ඇස්තමේන්තුගත වන කාෂි පාරක් රුපියල් 50,000/ ක පමණ සුළු මුදලකින් සකස් කිරීමට ගොවි සංවිධානය සමත් වූ බවත් ඒ සඳහා වාරි මාර්ග දෙපාර්තමේනතුව විසින් යන්ත්‍ර ලබා දුන් බවත් ඒ පිළිබඳ ස්තුතිය පුදකරන බවත්,එවැනි කෘෂිපාරවල් කිහිපයක් සකස් කිරීමට ඉදිරියේ දී බලාපොරොත්තු වන බවත් දේනියංගල කෘෂිපාර සකස් කිරීමට යාමේ දී වසමහාර කෘ.ප.නි.ස. විසින් එය වැලැක්වූ බවත්, එවැනි නිලධාරීන් මහජනතාවට අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදි.
වැව් පහ - සභාපති	පසුගිය කන්නවලදී ජල ගැටලු උග්‍රව පැවතියද මෙම කන්නයේ දී එවැනි තත්ත්වයක් ඇති නොවූ නමුත් ඇති වූ ජල ගැටලු වලට විසඳුම් ලබා දීමට වා.දෙ. කටයුතු කළ බවත් ඒ පිළිබඳ ස්තුතිවන්ත වන බවත් අනොකුත් ආයතනවලින් ලැබුන සහයෝගයට ද කෘතඥතාවය ඵල කරන බවත් ප්‍රකාශ කරන ලදි.
3 පියවර ප්‍රා..ගෙ.සං. සභාපති	2020 යල කන්න වගා කටයුතු පෙර කන්න කිරණවලට අනුව සිදු කළද සාර්ථකව වගා කටයුතු කිරීමට හැකියාව ලැබුන බවත් ඒ සඳහා සහයෝගය ලබාදුන් නේ.ව්‍යා.කළමනාකාරතුමා ඇතුළු නිළධාරීන් හා වාරිමාර්ග ඉංජිනේරුතුමා ඇතුළු නිළධාරීන්ටද ස්තුතිවන්ත වන බවත් තුන්වන කන්නයකට යාමේ හැකියාව පවතින බවත් ඒ සඳහා අවශ්‍ය ජලය හා බීජ ලබා දීමට අදාල ආයතන කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.
2 පියවර ප්‍රා.ගෙ.සං. සභාපති	ජල ගැටලු පිළිබඳ විසඳුම් ලබා දීමට ජල පාලන කමිටු රැස්වීමක් පැවැත්වීමට කටයුතු කල සියලු නිළධාරීන්ට ස්තුතිවන්ත වන බවත් ඩි 18 ප්‍රධාන ඇලට සම්බන්ධ දොරටුව කඩා ඉවත් කිරීම සම්බන්ධව හසලක පොලිසිය දැනුවත් කලද කිසිම ආකාරයක ක්‍රියාමාර්ගයක් නොගත් බවත්, ගොවි ගැටලුවලදී පොලිසියේ ක්‍රියාකලාපය සුබවාදී නොවන බවත්,ඒ පිළිබඳ පොලිසිය දැනුවත් කළ යුතු බවත්, ඇල සංවර්ධන කටයුතු පිළිබඳ මිණිපේ වම් ඉවුරු ඇල පුනරුත්ත්‍රාපන ව්‍යාපෘතිය සමග සාකච්ඡා අවශ්‍ය බවත්, සංවර්ධන කටයුතු අඩාල වීමට ඉඩ නොදිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.
1 පියවර ප්‍රා.ගෙ.සං. සභාපති	රටේ පැවති covid -19 වසන්ගත තත්ත්වය හේතුවෙන් ආදිරිනීතිය පැවති කාලය තුල වුවද යල කන්න වගා කිරණ පිළිබඳව සමස් ඇතුළු ගොවි ව්‍යායකාසියන් කිහිප දෙනෙකු විසින් 1,2 පියවර සියලු ගොවීන් දැනුවත් කිරීම සඳහා කටයුතු කළ බවත්, එහිදී විශාල කැප කිරීමක් කිරීමට සිදු වූ බවත් ශබ්ද විකාශන යන්ත්‍ර ලබා දීමට කටයුතු කල ඩි 49 සභාපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වන බවත් වාරි.දෙ.කැපවීම් මත අවශ්‍ය ජලය ලබා දීමට කටයුතු කිරීම නිසා යම් තරමක හෝ වගාව පවතින බවත්, මිණිපේ ගොවීන්ට සිදුවූ පොහොර අසාධාරනයට විරුද්ධව එකමුතු ගොවි සංවිධානය නමින් සංවිධානයක් උද්ඝෝෂණ පැවැත්වීමට හෙට දිනයේදී කටයුතු යොදා ඇති බවත්, මිණිපේ ඒකාබද්ධ ගොවි සංවිධානය නොදැනුවත්ව සිදු කරන මෙවැනි කටයුතුවලට මිණිපේ ගොවීන් සම්බන්ද නොවන බවත්, මිණිපේ ඒකාබද්ධ ගොවි සංවිධාන රැස්වීම ඉදිරියේදී පැවැත්වීමට කටයුතු යෙදිය යුතු බවටත් අදහස් දක්වන ලදි.

ඒකාබද්ධ ග්‍රා.සං.සභාපති	රටේ පැවති covid -19 වසන්ගත තත්ත්වය හේතුවෙන් ඇදිරිනීතිය පැවති බැවින් පොහොර පිළිබඳ නිවැරදි තොරතුරු දැනුවත් වීමට නොහැකි වූ බවත් , ගොවි ගැටලුවලදී පොලිසිය දක්වන සහයෝගය දුර්වල බවත් නේ.වා.කළමනාකාරතුමා විසින් ඒ බව පොලිසිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින බවත්. දළදා මාළිගාවේ ඇසළ පෙරහැර මංගල්‍ය යේ ආහාර වේල සඳහා මිණිපේ ව්‍යාපාරයෙන් හාල් කි.ග්‍රෑ 2500ක් පුලි මස වතා විට ලබා දෙවා ලෙස ඉල්ලීම් කර ඇති බවත් ඔක්.මාසයේ දළදා යල් අස්වනු සූදාව පවතින බැවින් ඊට සූදානම් විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි

යෙදවුම් හා සේවා සැපයීම

4 පියවර ප්‍රා.ග්‍රෙ.සං.සභාපති	ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් නිසි ක්‍රමවේදයකට අනුව සහනාධාර පොහොර ලබා නොදීම නිසා ගොවීන් මහත් අපහසුතාවයට පත් වී ඇති බවත්, කලට වෙලාවට පොහොර ලබා නොදීම නිසා වගාව මේ වන විට අසාර්ථක වී ඇති බවත්, එය අස්වැන්නට බලපෑම් එල්ල විය හැකි බවත් , පොහොර බෙදා දීමේදී සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් හා ගොවිජන සේවා නිළධාරීන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් අප්‍රසාදය එල කරන ලදි
3 පියවර ප්‍රා.ග්‍රෙ.සං. සභාපති	සහනාධාර පොහොර ලබා දීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීමත්, එහිදී යම් යම් අක්‍රමිකතා සිදු වූ බවත්, නිසි වෙලාවට පොහොර ලබා නොදීම නිසා ගොවීන් අපහසුතාවයට පත් වූ බවත් ඒ සම්බන්ධව බලවත් කණගාටුව ප්‍රකාශ කරන බවත්, කන්න කීරණ අනුව 60 %ක් වී ද, 40%ක් අතිරේක ශෝග වගාවද සිදු කිරීමට ගොවීන්ට නියෝග ලබා දුන්නද ඒ සඳහා අවශ්‍ය පොහොර ලබා නොදෙන්නේ නම් එය ගැටලුවක් බවත්, ඉන් අසරණ වන්නේ ගොවීන් බවත්,
2 පියවර ප්‍රා.ග්‍රෙ.සං.සභාපති	නිසි වේලාවට අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා දීමට කටයුතු නොකිරීම ගැටලු සහගත බවත්, වැඩි මිල පොහොර මේ වන විට අවම ප්‍රමාණයක් ලැබුනද එය ලබා දීමේ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් පවතින බවත්, එම පොහොර ද ප්‍රමිතියෙන් තොර බවත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ලබා දුන් දියර පොහොර (Biotin) ප්‍රමිතියෙන් තොර බවත්, වගාව අසාර්ථක වීමට එය බලපාන බවත්, පොහොර ප්‍රවාහන ගාස්තු පිළිබඳ ද ගැටලුකාරී තත්ත්වයක් පවතින බවත් , ඇල මාර්ග රක්ෂිත වෙන් කිරීම සිදු කළ යුතු බවත්
1 පියවර ප්‍රා.ග්‍රෙ.සං. සභාපති	• කන්න කීරණවලට අනුව ගොවීන් කටයුතු කළද ඒ සඳහා අවශ්‍ය පොහොර ලබා නොදීම තුලින් ගොවීන් මහත් අපහසුතාවයට මෙන්ම අසරණභාවයට පත් වී ඇති බවත් වගාවට අවශ්‍ය පොහොර නිසි වෙලාවට නොලැබීම හේතුවෙන් මේ වන විට වගාව අසාර්ථක වී ඇති බවත්, ප්‍ර.ග්‍රෙ.සං.සභාපති ලෙස කමන් ගොවීන්ට පිළිතුරු දියයුතු බවත්,ගොවිජන සේවා මධ්‍යස්ථානය හරහා ලබා දුන් දියරපොහොර (biotin) අනෙකුත් පොහොර වර්ගද ප්‍රමිතියෙන් තොර බවත්, කඩවලින් ලබා ගන්නා පොහොර ප්‍රමිතියෙන් 100% ක් උසස් බවත්,ගොවීන් අවතක්සේරු කරමින් රාජ්‍ය ආයතන මෙවැනි කටයුතු නොකරන ලෙසත්, මෙවැනි අකටයුතුකම් සිදුවන්නේ නම්, ඉදිරියේදී සහනාධාර පොහොර ලබා නොදෙන ලෙසත්, මුදල්වලට හෝ ප්‍රමිතියෙන් යුතු පොහොර ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.
ඒ.ග්‍රෙ.සං.සභාපති	මේ වන විට රට තුල ප්‍රමාණවත් පරිදි පොහොර පවතින නමුත් එය බෙදා දීමේ නිසි ක්‍රමවේදයක් නොමැති වීම ගැටලුකාරී බවත්, ලබා දුන් දියර පොහොර කිසිදු ආකාරයක ප්‍රමිතියක් නොමැති බවත්, වැඩි මිලට හෝ පොහොර ලබා දීමට කටයුතු කරන ලෙසත්,

ගොවිජන . සේ.ප්‍රා.නිලධාරි - ටල්පසගම	ගො.සේ.කාර්යාලවලට පොහොර ලැබුන ආකාරයට ඒවා ගොවීන්ට බෙදාදුන් බවත්, ප්‍රමාණවත් තරම් පොහොර නොලැබීම සම්බන්ධයෙන් තමන්ට කලහැකි දෙයක් නොමැති බවත් තම කාර්යාලවල අවම නිලධාරීන් පිරිසක් සිටීමත් සියලු කටයුතු එම නිලධාරීන් විසින් කළයුතු බැවින් ගොවීන් අපහසුතාවයට පත්වන්නට ඇතැයි සිතන බවත් , ප්‍රමාණවත් පොහොර නොලැබීම දිගින් දිගටම පැවතියහොත් කාඛනික වගාවකට ඉදිරියේදී සියලු දෙනාට යොමුවීමට සිදුවියහැකි බවත් ඉදිරියේදී තම කාර්යාලවලට පොහොර ලැබුනහොත් ඒවා ලබාදීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරනා ලදී.
කෘ.ප.නි.ස.නිලධාරි , ගොවිජන සේවා කාර්යාලය, මොරයාය,	පොහොර සම්බන්දයෙන් ගොවීන් දැනුවත් කිරීමට කාලයක් නොවූ බවත්, පොහොර ප්‍රමාදවීම සම්බන්ධ ගැටලුවේදී කෘ.ප.නි.ස. නිලධාරීන්ගේ ප්‍රමාදයක් ලෙස චෝදනා කිරීම සුදුසු නොවන බවත්, කාර්යාලවලට පොහොර ලැබුන ප්‍රමාණය ගොවීන් අතර බෙදා දීමට කටයුතු කළ බවත්, මුල්කාලවලදී TSP නොලැබුන බවත්, යූරියා සහ MOP පමණක් ලැබීම නිසා ඒවා ගොවීන්ගේ කැමැත්ත අනුව බෙදා දීමට කටයුතු කල බවත්, වැඩිමිල පොහොර ටොං 15ක් ලැබුණ බැවින් ඒවාද ගොවීන් අතර බෙදා දීමට කටයුතු කල බවත්, සභාපතිවරුන්ගේ සහයෝගය අවශ්‍ය බවත් වැඩි දුරටත් අදහස් දක්වන ලදී.
ඩි 43 ගො.සං.සභාපති	පැතිර යන කීඩැ උවදුර හා අනෙකුත් කෘමි උවදුරු අවම කර ගැනීමට පිදුරු ගිණිකැබීම කළ යුතු බවට වගකිවයුතු නිලධාරීන් පවසා ඇති බවත්, කන්න කීරණවලදී පිදුරු ගිණිකැබීම නොකලයුතු බවත් කාඛනික වගාවට යොමු වන්නේ නම් එම පිදුරු අත්‍යවශ්‍ය බවත් , නිලදාරීන් විසින් එසේ උපදෙස් දීම සිදු නොකලයුත්තක් බවත් අදහස් දක්වන ලදී.
කෘෂිකාර්මික සංවර්ධන	
4 පියවර ප්‍රා.ගො.සං. සභාපති	යල කන්න වගා කටයුතු වෙලාසන අවසන් කිරීමට හැකි බැවින් තුන්වන කන්නයකට යාමේ හැකියාව පවතින බවත් ඒ සඳහා අවශ්‍ය ජලය හා බීජ ලබා දීමට කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ කෘතඥ වන බව ප්‍රකාශ කරන ලදී.
3 පියවර ප්‍රා.ගො.සං.සභාපති	තුන්වන කන්නයකට යාමේ හැකියාව පවතින බවත් ඒ සඳහා අවශ්‍ය බීජ ලබා දීමට අදාල ආයතන කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.
සහකාර කෘ.අධ්‍යක්ෂ	Covid -19 වසංගත තත්ත්වය නිසා ඇදිරිනීතිය පැවති කාලය තුල වුවද තම නිලධාරීන් කටයුතු කල බවත්,අතිරේක බෝග වගාව ක්ෂේත්‍රය තුල යම් ආකාරයක ප්‍රමාණවත් තරම් වගා කර ඇති බවත් බීජ නොමිලේ ලබා දීමට කටයුතු කල බවත්. අතිරේක බෝග වගාකිරීමේ දී ගස් අතර නියමිත දුර ප්‍රමාණය තබා ගනිමින් එම කාක්ෂණික දැනුමට අනුව වගා කලයුතු බවත් පිදුරු ගිනිකැබීම සම්බන්දයෙන් තමන් කිසිම නිලධාරියෙකුට කිසිදු ආකාරයක උපදෙසක් ලබා දී නොමැති බවත් බයෝටින් දියර පොහොර පිළිබඳ කෘ.දෙපාර්තමේන්තුව දැනුවත් කර නොමැති බවත්, තුන්වන කන්නයකට යන්නේ නම් අවශ්‍ය බීජ හා තාක්ෂණික උපදෙස් ලබා දීමට කටයුතු කල හැකි බවත් ඒ සඳහා තම නිලධාරීන් කැපවී සිටින බවත් දන්වා සිටින ලදී.
වාරිමාර්ග කටයුතු	
4 පියවර ජී.ගො.සං.සභාපති	ක්‍රිප් ව්‍යාපෘතිය හරහා ඇල සංවර්ධනය කිරීම සඳහා මිණිපේ ගොවීන් කන්නක් කැප කිරීමේ ප්‍රතිඵල පිළිබඳ යතුවුවන බවත් එහි යහපත් ප්‍රතිඵල මේ වනවිට ගොවීන් ඉක්සි විදින බවත් , මෙම කන්නයේදී ජල ගැටලුවලින් තොරව වගා කටයුතු සිදු කිරීමට හැකියාව ලැබුන බවත්
කරුවුගහවැව සභාපති	කොන්ත්‍රාත් මුදල් මේ වන තෙක් නොලැබීම නිසා අපහසුතාවයට පත් වී ඇති බැවින් එම මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී

3 පියවර ප්‍රා.ගො.සං.සභාපති	රදුන්නවැව ගැටළුව සඳහා ස්ථිර විසඳුමක් නොලැබෙන්නේ නම් ගොවීන්ගෙන් බරපතල ලෙස වෝදනා එල්ලවියහැකි බවත්, 51 ගො.සං. කුණු කදුර ඉවත්කර දෙන ලෙසත්, 47 ගො.සං.නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බවත් එහි ඉදිරි සං. කටයුතු කෙසේද යන්නත්, රක්ෂිත වෙන් කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳ අවධානය යොමු කරන ලෙසත් අදහස් දක්වන ලදී.
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු-හසලක	මෙවර යල කන්නය ජල ගැටලුවකින් තොරව කිරීමට හැකිවීම පිළිබඳ සතුටුවන බවත්, ඉදිරියේදී කළමනාකරණයකින් යුතුව ජලය භාවිත කළ යුතු බවත් දැන්වීය. පියවර 3 සැපයුම් ඇල සංවර්ධනය කිරීමේ කටයුතු මිණිපේ වම් ඉවුරු ඇල ව්‍යාපෘතිය හරහා සිදු කරන බවත්, පිසෙප් ව්‍යාපෘතිය මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම අවිනිශ්චිත විය හැකි බවත් රක්ෂිත තුල හා ඇලට හානිවන ගස් ඉවත් කිරීම සම්බන්ධව අදාල ආයතනවලට යොමු කර එම කාර්යය කළයුතු බවත්, ජලපාලන කටයුතු සඳහා ගෙවීම් ප්‍රතිපාදන ලැබෙන පරිදි ගෙවීමට කටයුතු කරන බවත්, මෙම වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති නිසා ඒවා ලැබීමේදී ද ප්‍රමාදයක් විය හැකි බවට අදහස් දක්වමින් කන්න සාර්ථකව අවසන් කර ගැනීමට හැකිවේවායි සුභ ප්‍රාර්ථනා කරන ලදී.
මිණිපේ වම් ඉවුරු ඇල පුනරුත්ථාපන ව්‍යාපෘතිය	
සංනිවේදන නිලධාරි	සෑම ගොවි සංවිධානයකට අදාලවම සංනිවේදන සුවරු ක්ෂේත්‍රය තුල යොදා ඇති නමුත් කිහිපයක හැර කන්න සීරණ එහි සඳහන් කර නොමැති බවත්, ගොවි සංවිධාන කිහිපයක් සම්බන්ධ කර ගනිමින් බික්කර වී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල බවත්, බික්කර වී පනත යටතේ ලබාගත් ලේබල් සුරක්ෂිතව තබා ගන්නා ලෙසත්, ව්‍යාපෘතිය මගින් ලබා දුන් පුවක් ,පොල් පැල රක්ෂිත තුල සිටුවීමට කටයුතු කරන ලෙසත් කෙත් ඇල සංවර්ධන කටයුතුවල රැඳවුම් මුදල් ලබා දෙන ලෙසට ව්‍යාපෘති අධ්‍යක්ෂකට ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
වනජීවී ක්ෂේත්‍ර නිළධාරි	වනඅලි ගැටලුව පිළිබඳ අදහස් දක්වමින් ප්‍රමාණවත් තරම් නිලධාරීන් නොමැති වීමත් එක වාහනයකින් සියලු ප්‍රෙදශ ආවරණය කිරීමට හැකියාවක් නොමැති බවත්, අලි ඵලවීම සඳහා අලි වෙඩි ද ප්‍රමාණවත් තරම් ලබා දී නොමැති බවත්, ලබා දී ඇති අලි වෙඩි ගොවීන් අතර බෙදා දීම සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදී.
නේ.ව්‍යා. කළමනාකරු	පැනනැඟුන ගැටලුවලට නිසි විසඳුම් ලැබෙන්නට ඇතැයි විශ්වාස කරන බවත්, ගොවීන් හා රාජ්‍ය නිලධාරීන්ගේ අදහස් කුමක් වුවද අවසානයේ එකම අරමුණකට යොමු වියයුතු බවත්, වසවිසෙන් තොර දේශීය වී (බටපොල ඇල) වගාව අක්කර 140ට වඩා වැඩි ප්‍රමාණයක ව්‍යාප්ත කිරීමට පසුගිය කාලය තුල ක්‍රියාකල බවත්, මිණිපේ ව්‍යාපාරය තුල බික්කර වී අක්කර 50ක පමණ සිදුකිරීමත්, 3 පියවර ඩි 47 නියමු ව්‍යාපෘතියක් සිදුකරන බවත්, ඊට අමතරව පියවරකට එක බැගින් හෝ එම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉල්ලීම් කර ඇති බවත්, ජලපාලන කමිටු පවත්වා ගොවි සංවිධාන අතරද ජල කළමනාකරණ කටයුතු කර ගැනීමට කටයුතු කරන ලෙසත්, පොහොර ගැටලුව මිණිපේ ව්‍යාපාරයට පමණක් සීමා වූ ගැටලුවක් නොවන බැවින් ඒ පිළිබඳ ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුවෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත්, සියලු ම ආයතන සම්බන්ධ වෙමින් ගොවීන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දීමට කටයුතු කලයුතු බවත්, එවිට සියලු දෙනාගේ අරමුණු ඉටුකරගැනීම පහසුවන බවට අදහස් දක්වමින් ව්‍යාපාර කමිටු ලේකම් මහතාට ස්තුති කතාව සඳහා අවස්කාව ලබා දෙන ලදී.
ව්‍යාපාර කමිටු ලේකම්-	<u>ස්තුතිය</u> ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා පැමිණි සියලුම රාජ්‍ය නිලධාරීන් ඇතුළු ගො.සං නිලධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් රැස්වීම කටයුතු අවසන් කරන ලදී.

එස්.එච්.එල්.දයාපාල,
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මිණිපේ

එස්.එච්.එල්.දයාපාල
නේවාසික ව්‍යාපාර කළමනාකරු
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මොරුගය - මිනිපේ